**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.71,748,242 ක් වූ අතර ඉන් රු.39,511,442 ක ශේෂයක් නැව් සමාගම් හා බන්ධිත ගුදම් 84 කින් අයවිය යුතු ශේෂ වූ අතර එම ශේෂ තහවුරු කර ගැනීම අදාල ආයතන වෙතින් ශේෂ සනාථන ලිපි ලබාගෙන නොතිබුණි. | ණයගැති ශේෂයන් ලබාගනු ලබන්නේ නැව් සමාගම් / නැව් නියෝජිත ආයතන තම කාර්යය සිදුකර ගැනීමට ප්‍රථමයෙන් ලබා දෙනු ලබන ඇස්තමේන්තු අගය මත වන අතර ගෙවීම් සිදු කිරීමේදී බොහෝවිට මෙම අගයන් වෙනස් වනු ඇත.මේ හේතුව නිසා අදාල ආයතන වලින් ශේෂ තහවුරු කර ගැනීමේ ලිපි ලබාගෙන නොමති අතර ඉදිරියේදී එවැනි ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීමට කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වනු කැමැත්තෙමි. | දෙපාර්තමේන්තුව ණයගැති ශේෂ තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | අතිකාල ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සඳහා අතිකාල ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇස්තමේන්තුගත අතිකාල පැය හා අනුයුක්ත කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් අදාල ආයතනයන් සමඟ ඇතිකරගත් එකඟතාවයන් ඇතුලත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුණි. | අතිකාල ආදායම් රැස් කරන ස්ථාන සඳහා සේවා සපයන නිලධාරීන් සංඛ්‍යාව නිශ්චිත නොමැති අතර සේවා අවශ්‍යතාව මත යොදවනු ලබන නිලධාරීන් ගණන හා යොදවනු ලබන පැය ගණන තීරණය වේ. ගෙවනු ලබන රේටයන් තීරණය වන්නේ අංක 1520/17 දරණ 2007 ඔක්තෝබර් 26 දිනැති ගැසට් පත්‍රයට අනුව බව සඳහන් කරමි. | අදාල ආයතනයන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314 ක මුදල බාහිර ආයෝජනවල යෙදවීම තුළින් උපයා තිබූ පොලී ආදායම රු.14,181,228 ක් සමඟ සමස්ථ ආයෝජනය රු.14,434,542 ක් විය. මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්තමානයේදී සේවා සැපයීම් පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය වගකීම් සහ ආයෝජන යටතේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | විමසුමේ සඳහන් පරිදි අදාල ආයතන 75න් මේවන විට ආයතන 11 ක් වෙත තැන්පත් කර ඇති මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර ඉන් ඉදිරිපත් වූ ආයතන 3 ක් වෙත අදාල ඉතිරිකිරීමේ බැංකු පාස් පොත් 4ක් නිදහස් කර ඇත. ඉතිරි ආයතන සම්බන්ධයෙන් ද තැන්පතු නිදහස් කිරීමේ කටයුතු මේ වනවිට ආරම්භකර ඇත. | වර්ථමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනයකර නිසි ගිණුම් තැබීමක් සිදුකිරීම හෝ අවශ්‍ය වෙනත් කටයුතු සිදුකළයුතු බව. |
| (ආ) පෙර වර්ෂයේ ණයගැති ශේෂය රු.8,230,180 කින් අධිතක්සේරු කර තිබූ අතර එය ප්‍රවර්ථන වර්ෂයේ හිමිකම් වෙනස්වීම් ලේඛනයේ සමුච්චිත අරමුදල් ශේෂයට ගැළපුම් කර තිබුණද, එලෙස වැඩියෙන් දැක්වීම සනාථ කිරීම සඳහා විධිමත් සාක්ෂියක් හෝ මූලාශ්‍ර ලේඛණයක් ඉදිරිපත් නොවූ අතර ශේෂ ගැලපීම ජර්නල් සටහනක් මගින් සිදුකර නොතිබුණි. | පෙර වර්ෂයේ ණයගැති ශේෂය රු. 8,230,180 කින් අධිතක්සේරු කිරීමට හේතු වූ කරුණු පහත දක්වා ඇත.<br>• එකම ආයතනයෙන් ලැබිය යුතු මුදල් දෙවරක් සටහන් වී තිබීම.<br>• ආයතන විසින් මෙම කාර්යාලය වෙත ගෙවීම් සිදුකල චෙක්පත් සටහන් වී තිබීමේ ප්‍රමාද දෝෂයන් හා එම මුදල් තවදුරටත් ලැබිය යුතු ණය ලෙස සටහන් වී තිබීම.<br>ඉදිරියේදී මෙවැනි සටහන් ජ'නල් සටහන් මගින් ගිණුම් තැබීමට සටහන් කරගන්නා ලදී. | ශේෂ තහවුරු කිරීම සඳහා විධිමත් සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර නිසි පරිදි ජර්නල් සටහන් මගින් ගිණුම් තැබීමට පියවර ගත යුතුය. |

### 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු.71,748,242 ක් වූ අතර එයින් රු.15,478,888 ක ශේෂයක් වර්ෂය ඉක්මවා පැවත එමින් තිබුණි. එයින් ආයතන 25 කට අයත් රු.4,732,663 ක ශේෂයක් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ නොවෙනස්ව පැවති අතර 2020 වර්ෂයේ අවසන් ගිණුම් තුළ ඇතුළත් නොවූ නමුත් 2021 අවසන් ගිණුම් තුළ 2018 සහ 2019 වර්ෂවල ලැබිය යුතු ලෙස සඳහන්ව තිබූ ශේෂය රු.2,302,179 ක් විය. | නිරීක්ෂණයට එකඟ වන අතර ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වූ ප්‍රමාද දෝෂයක් බව සඳහන් කරන අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 17 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවෙකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී , සමාලෝචිත වර්ෂය සඳහා රු.948,323,405 ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව ඇඟිලි සටහන් යන්ත්‍රය භාවිතා කිරීමේදී පැන නැඟිය හැකි ගැටලු පිළිබඳව පැහැදිලි කරමින් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත අංක හා 2022.01.25 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර එම උපදෙස් ලද පසුව ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.<br>රේගු දෙපාර්තමේන්තුවේ අතිකාල ගෙවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2022.02.14 දින රේගුවේ සියලු නිලධාරීන් නියෝජනය වන සේ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ලද පසු අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරින්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළයුතු බව. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876 (2) (ඇ) ඡේදය | අතිකාල අරමුදල තුළ භාණ්ඩාගාර අරමුදල ලෙස රු 1,948,778,712. ක මුදලක් දීර්ඝ කාලයක සිට සමුච්චිත වෙමින් පැවතිය ද විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම අතිරික්ත මුදල් සමාලෝචිත වර්ෂයේදී ද ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | ගිණුමේ නාමික වශයෙන් පවතින 2021.12.31 දිනට ශේෂය වන රු.1,948,778,712 ක සමුච්චිත මුදල අතිරික්ත මුදලක් ලෙස දක්වා තිබුන ද මෙම ශේෂය භෞතිකව දෙපාර්තමේන්තු ගිණුමෙහි නොපවතින අතර පවත්නා ක්‍රමවේදයට අනුව දැනටමත් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම (ඒකාබද්ධ අරමුදල) වෙත ප්‍රේශණය කර ඇත. | අදාල චක්‍රලේඛය අනුව සමුච්චිත වෙමින් පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර ඒකාබද්ධ අරමුදලට බැරකලයුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 176,966,439 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 141,774,897 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 35,191,542 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අතිකාල ගෙවීම් වියදම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂය සඳහා අතිකාල ආදායම් ලෙස රු.854,372,907 ක් රැස් කර තිබුණි. ඒකාබද්ධ අරමුදල සඳහා වූ දායකත්වය හා ණයගැතියන් සඳහා වෙන්කිරීම් ගැලපූ පසුව අරමුදලේ ශුද්ධ වියදම රු.945,599,889 කි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අතිකාල අරමුදලේ ඌණතාවය රු.176,966,439 ක්ව තිබුණු අතර එම ඌණතාවය පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුළ අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. මෙම ඌණතාවය ඇතිවීම කෙරෙහි 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම සියයට 50 කින් වැඩිකර තිබීමට ගත් තීරණය හේතුවී ඇත. අතිකාල රේට ඉහල දැමීමට හා අතිකාල ගෙවිය යුතු නව පාර්ශවයන් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කමිටුවක් විසින් අවිධිමත් තීරණයක් ගෙන තිබුණ ද මේ සඳහා නිශ්චිත වලංගු අනුමැතියක් ලැබාගෙන නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මු1/රේගු/47/3 දරණ 2004.02.09 දිනැති ලිපිය ට අනුව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ, රේගු නිලධාරීන්ගේ අතිකාල දීමනා ගණනය කිරීම ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 6.1 උප වගන්තිය ප්‍රකාරව ගෙවීම් කිරීමට අනුමත කර ඇත. එම අනුමත පැයක රේටය වන්නේ මාසික ඒකාබද්ධ වැටුපෙන් 240 න් එකකි. නමුත් මෙම දෙපාර්තමේන්තුවේ මේ දක්වා ගණනය කරනු ලබන පැයක රේටය ගනු ලබන්නේ වර්තමාන වැටුප පදනම් කොටගෙන නොවන අතර 2004 නොවැම්බර් 30 දිනට අදාල ඒකාබද්ධ වැටුප පදනම් කොටගෙන වේ.<br>දිගු කාලයක සිට අඩු රේටයන් යටතේ විවිධ සේවා ස්ථානවල අවම පහසුකම් යටතේ සේවය කරන නිළධාරීන්ගේද පැමිණිලි සැලකිල්ලට ගනිමින් අතිකාල රේටය වැඩි කලද නිලධාරීන්හට වර්තමානයේ ගෙවීම් කරනුයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලද ඔවුනට හිමි පැයක රේටයට වඩා ඉතා අඩු රේටයක් බව සඳහන් කරමි. | අදාල අරමුදලේ ලැබීම් ඉක්මවා ගෙවීම් කිරීම පිළිබඳව කළමනාකරණයේ දැඩි අවධානය යොමුකර අතිකාල ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කළ යුතු වීම. |
| (ආ) අරමුදලේ ඌණතාවය පසුගිය වර්ෂයට වඩා රු. 35,191,543 කින් වැඩි වී තිබුණු අතර ඌණතාවය පියවා ගැනීම සඳහා සමුච්චිත අරමුදල් යොදා ගැනීම මත 2018 වර්ෂයේ සිට සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහෙමින් පැවතුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රු.2,331,074,672 ක්ව පැවති සමුච්චිත | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලේ ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විට රු. 1,948,778,712 ක් දක්වා අඩුවී තිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුව අතිකාල ආදායම් හඳුනාගැනීමේදී ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සඳහා ආදායම් වෙන් වෙන්ව හඳුනාගැනීම සිදුකර තිබුණ ද ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සඳහා අතිකාල වියදම වෙන්වෙන්ව හඳුනා ගැනීම සිදුකර නොතිබුණි. ඒ අනුව අතිකාල සේවා සපයන මධ්‍යස්ථාන සඳහා අතිකාල ගෙවීම් හඳුනාගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොපවතින අතර අතිකාල ගෙවීම් වටිනාකම මාසිකව හඳුනාගැනීම පමණක් සිදු කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමේ අවශ්‍යතාවයට අනුව ආදායම් රැස්කිරීම අංක 1520/17 දරණ 2007 ඔක්තෝබර් 26 දිනැති ගැසට් පත්‍රයට අනුව සිදුවේ.<br>රේගු දෙපාර්තමේන්තුවේ පවතින කාර්යභාරයන් අනුව ආදායම් අයකල හැකි මෙන්ම අයකල නොහැකි ස්ථානවලද සේවා අවශ්‍යතාවය මත පැය 24 පුරාම නිලධාරීන් සේවයේ යොදවා ඇත. ඒ අනුව, රේගු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු 2342 ක් වන නිලධාරීන් ට අතිකාල සකස් කිරීම ගිණුම් අංශයේ නිලධාරීන් 12 ක් විසින් සිදුකරන අතර අතිකාල ගණනය කිරීමේ පහසුව සඳහා නිලධාරීන්ගේ තනතුරු නාමය අනුව අදාල ලේඛන පිළියෙල කරන බව සඳහන් කරමි. | අතිකාල ගෙවීම් හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 103 වැනි වගන්තියේ රෙගුලාසි ප්‍රකාරව රේගුවේ නිලධාරීන් සඳහා නියම කර ඇති සාමාන්‍ය රාජකාරි වේලාවන් පිටස්තර වේලාවන්හිදී හෝ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවල එම නිලධාරීන් විසින් ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අයකරනු ලබන සියලුම මුදල් සහ ඕනෑම රේගු නිලධාරියෙකු ස්වකීය නියම කාර්යාලයේ හෝ සේවා නියුක්ත ස්ථානයෙහි හෝ හැර වෙනත් කිසියම් කාර්යාලයක හෝ ස්ථානයක රාජකාරියෙහි නිරතවීම වෙනුවෙන් එකතු කරන ගාස්තු හෝ අයකිරීම් අතිකාල ගිණුමට බැර කල යුතු වේ. ඒ අනුව රේගු නිලධාරීන් අතිකාල වැඩ නිරතවීම තුලින් ලබන මුදල් පාදකව අතිකාල ගෙවීම් සිදු කල යුතු වේ. එහෙත් අතිකාල අරමුදලට අයකරනු ලබන අතිකාල රේටයන් සංශෝධනය කර නොතිබියදී ගෙවනු ලබන අතිකාල රේටයන් පමණක් අවස්ථා 02 කදී සංශෝධනය කර තිබීම හා රේගු නිලධාරීන්ට අමතරව | රේගු ආඥා පනතේ දක්වා ඇති පරිදි "රේගු කටයුතු සඳහා යොදවා ගන්නා පුද්ගලයන් ඒ සේවයෙහි යෙදී සිටින නිලධාරීන් ලෙස සලකනු ලැබේ.<br>ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා සෘජුව සහ වක්‍රව සම්බන්ධ වන සියලු නිලධාරීන්හට අතිකාල ගෙවන අතර විමසුමේ දක්වා ඇති පරිදි අතිකාල අරමුදලට අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධ කටයුතු ඉදිරියේදී සිදුකිරීමට සටහන් කරගත් බව සඳහන් කරමි. | රේගු නිලධාරීන් අතිකාල වැඩ නිරතවීම තුලින් ලබන මුදල් පාදකව අතිකාල ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි මෙම අරමුදලින් අතිකාල ගෙවීම හේතුවෙන් එලෙස අතිකාල අරමුදල් ගිණුමේ ශේෂය සෘණ අගයක් ගෙන තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ රේගු ආඥා පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව විටින්විට රේගු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛණ හා විධිවිධාන මත පදනම්ව වන අතර, එක් එක් නිලධාරියා අනුයුක්ත අංශය පදනම් කොටගෙන ගෙවිය යුතු අතිකාල පැය ගණන අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර ඇති අතිකාල කමිටුවේ නිර්දේශ මත නියම කරනු ලබයි. කෙසේ වුවත්, රේගු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන් අනුව නිලධාරීන් සේවයේ යෙදවීම සීමා කිරීම් කල හැක්කේ ඉතාමත් අවම මට්ටමකින් බව වැඩිදුරටත් සඳහන් කරමි. | වර්තමාන අතිකාල ගෙවීම් ක්‍රියාවලිය සමාලෝචනය කර විධිමත් කිරීම. |
| (ආ) වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.93,950,498 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව රැස් කළ අතිකාල ආදායම ඉක්මවූ වියදම රු.32,434,768 කින් ඉහළ ගොස් තිබුණි. | 2021 වසරේ දී රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු ආදායම පහල බැසීමට පහත හේතූන් බලපා ඇත.<br>• කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සිදු වූ ගුවන් ගමන් හා නැව්බඩු ප්‍රවාහනය සංකෝචනය වුවද වරාය හා ගුවන් තොටුපල රාජකාරිවලට අදාලව රේගු නිලධාරීන් යොදවා තිබීම<br>• රටෙහි අයහපත් ආර්ථික තත්වය මත වරින්වර සිදුකරන ලද ආනයන සීමා කිරීම්. | විධිවිධාන ප්‍රකාරව මෙම අතිකාල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගනු ලබන්නේ රේගුව විසින් සේවා සපයන බාහිර ආයතනවලින් වේ. එම බාහිර ආයතනවලින් රැස්කරගෙන අරමුදල් ඉක්මවා අතිකාල ගෙවීම් සිදු නොකිරීමට කළමනාකරණය විසින් පියවර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමේ ප්‍රවර්ථන වර්ෂයේ ආදායම රු.51,342,118 කින් අඩුවී තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 16.85% ක පහළ යෑමකි. | - එම - | ආදායම් ඉපැයීම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිකාල අරමුදලේ 2021 ආදායම ලෙස රු.1,055,739,250 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද උපයාගත් සත්‍ය ආදායම රු.854,372,907 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායමේ රු.201,366,343 ක අහිතකර විචලතාවයක් නිරීක්ෂණය විය. මෙය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 ක පිරිහීමකි. ඊට ප්‍රධාන හේතු වශයෙන් ‘‘කොළඹ’’ අනුශීර්ෂය යටතේ වූ ආදායම රු.207,450,430 කින් අඩුවීම බලපා තිබුණි. ඒ අනුව අතිකාල අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු.165,325 ක අතිරික්ත ආදායමක් අපේක්ෂා කළද ප්‍රතිඵලය වී තිබුණේ රු.176,966,439 ක ඌනතාවයකි. | අයවැය ලේඛනයට අදාල ඇස්තමේන්තු සකස්කිරීම පෙර වර්ෂයේ තුන්වන කාර්තුවේදී සිදුවන අතර ප්‍රවර්තන වර්ෂයේදී සත්‍ය ආදායම් ලැබීමේ විචලතාවයන් පැවතිය හැකිය. 2021 වසරේ දී සත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා පහල බැසීමට පහත හේතූන් බලපා ඇත.<br>• කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ගුවන් ගමන් හා නැව්බඩු ප්‍රවාහනයේ සංකෝචනයන් සිදුවූව ද වරාය හා ගුවන් තොටුපල රාජකාරිවලට අදාලව රේගු නිලධාරීන් යොදවා තිබීම<br>• රටෙහි අයහපත් ආර්ථික තත්වය මත වරින්වර සිදුකරන ලද ආනයන සීමා කිරීම | අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කළ යුතුය. |